# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ "ප්‍රවෘත්ති සංස්කාරක - ඉංග්‍රීසි (කොන්ත්‍රාත්)" තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන හා**
**වෘත්තීය සුදුසුකම්** : **පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 සුදුසුකම් සම්පූර්ණ කර තිබීම**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (ඉංග්‍රීසි භාෂාව, ජනසන්නිවේදනය, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව) ලබා තිබීම

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (7) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හයවැනි (6) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (5) ක පළපුරුද්දක් ලබා තිබීම.

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 22 ත් 45 ත් අතර විය යුතුය.

**මාසික දීමනාව** : මූලික දීමනාව - රු. 58,598/-

**සෙසු දීමනා හා වරප්‍රසාද :** ජීවන වියදම් දීමනාව , දිරි දීමනාව , ආහාර දීමනාව, රක්ෂණ පහසුකම්

**අතිරේක සුදුසුකම්** : ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා දැනුමක් තිබීම හා ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

මෙය කොන්ත්‍රාත් තනතුරකි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගැනීම් සිදු කරනු ලබන අතර තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අයදුම්පත් 2026.08.17 දිනට පෙර තනතුරේ නම සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ jobs@rupavahini.lk යන විද්‍යුත් ලිපිනයට හෝ එවන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව,**
**නිදහස් චතුරශ්‍රය,**
**කොළඹ 07.**
**දුරකථන අංකය: 011-2698187**
**වෙබ් අඩවිය : www.rupavahini.lk**